**ශීර්ෂය - 420 - පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

**------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මතය

-------

පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 01 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 18 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

-------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) මුළු ප්‍රතිපාදන හා වියදම** | | |
| **(i)** වැඩසටහන් අංක 1 හා 2 යටතේ පුනරාවර්තන වැය විෂයන් 03ක සලසා තිබූ ප්‍රතිපාදන රු.10,600,000න් මුළු ප්‍රතිපාදනයම හෙවත් ප්‍රතිශතයක් වශයෙන් සියයට 100ක් ඉතිරි කර තිබුණි. | 2021 වර්ෂයේ ලෝකයේ පැවති කෝවිඩ් වසන්ගත තත්වය හේතුවෙන් විදේශ සංචාර වල නොයෙදීම,රාජ්‍ය අමාත්‍ය කාර්යය මණ්ඩලය නිල ඇඳුම් හිමිකම නොපෑම, නැගී එන කළාප වල ග්‍රාමීය යටිතල පහසුකම් යටතේ කල්බදු ක්‍රමයට ගත් වාහන සඳහා පොලී ගෙවීම වෙනුවෙන් අයවැය ඇස්තමේන්තු මගින් 420-2-3-12-1406-0/12 යටතේ ප්‍රතිපාදන සලසා තිබුණ නමුත් අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/GPS/155/08/03 හා 2021.07.13 ලිපියට නුව පරිපාලන හා ආයතනික වියදම් වැය විෂයක් ඇතිකර මු.රෙ.66 මගින් ප්‍රතිපාදන සලසාගෙන වියදම් දැරීම යන හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | ඇස්තමේන්තු සකස් කිරීමේදී අතාත්ත්වික නොවන පරිදි පිළියෙල කිරීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු කළ යුතුය. |
| **(ii)** වැඩ සටහන් අංක 1 හා 2 යටතේ ප්‍රාග්ධන වැය විෂයන් 12 ක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන රු.113,000,000 ක් වන මුළු ප්‍රතිපාදනයම හෙවත් සියයට 100ක් ඉතිරිව තිබුණි. | රටෙහි පැවති අයහපත් සෞඛ්‍ය තත්වය මත සංචරන සීමා පැනවීම, රට වසා දැමීම, නිළධාරීන් චක්‍රීයව සේවයට කැදවීම නිසා යන්ත්‍රොපකරණ භාවිතය අඩු වීම,ක්‍රමවත්ව ආයතන කටයුතු නොපැවැත්වීම, වාහන භාවිතය අඩු වීම, ගරාජ වසා දැමීම නිසා විශාල අළුත්වැඩියවන් නිසි පරිදි සිදු නොකිරීම ආදී විවිධ හේතු මත ප්‍රතිපාදන ඉතුරු විය. | -එම- |
| **(iii)** වැඩසටහන් අංක 1 යටතේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයන් 22 ක හා 5 ක ප්‍රතිපාදන මුදලින් පිළිවෙලින් රු.30,850,278ක් හා රු.34,068,520ක් වශයෙන් | රාජ්‍ය අමාත්‍යවරයාට මුළු වර්ෂයටම ප්‍රතිපාදන වෙන් කර තිබුනද 2021 මාර්තු මස පත්වූ බැවින් එදින සිට වැටුප් ගෙවීම, කෝවිඩ් වසංගත තත්වය, සංචරන සීමා නිසා යන්ත්‍ර සූත්‍ර භාවිතය අඩු වීම, අමුද්‍රව්‍ය | -එම- |

| | | |
|---|---|---|
| උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 37ක් හා සියයට 66 ක් විය. | හිඟකම නිසා ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදු නොකිරීම, අමාත්‍ය කාර්යාලය හා නිළධාරීන් කණ්ඩායම් වශයෙන් වාහන භාවිතා කිරීම, අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සීමා වීම, දේශීය ගමන් සීමා වීම, කාර්යාල අඛන්ඩව නොපැවැත්වීම, දේපල ණය ලබා ගැනීමේ ප්‍රමාණය අඩු වීම, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මෙහෙයුම් කටයුතු අපේක්ෂිත පරිදි ඉටු නොවීම ආදී හේතූන් ප්‍රතිපාදන ඉතිරියට බලපා තිබුණි. | |
| **(iv)** වැඩසටහන් අංක 02 යටතේ පුනරාවර්තන වැය විෂයන් 1 හා ප්‍රාග්ධන වැය විෂයන් 8ක ප්‍රතිපාදන මුදලින් පිළිවෙලින් රු.266,251,558ක් හා රු.3,250,590,966ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 58ක් හා සියයට 72ක් විය. | රටෙහි පැවති අයහපත් වාතාවරනය නිසා අපේක්ෂිත පරිදි වියදම් ඉදිරිපත් නොවීම, ගොඩනැගිලි ද්‍රව්‍ය හිඟ වීම,මිලදී ගැනීම් අධෛර්යමත් වීම, කාර්යය මණ්ඩල බදවා ගැනීම් ප්‍රමාද වීම, රට වසා දැමීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම, අපේක්ෂිත කාර්යය සාධනය ළඟා කර ගත නොහැකි වීම, මත ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | -එම- |
| **(v)** ඇස්තමේන්තු සලසා ගෙන නොතිබූ වැය විෂයන් 03 ක් සඳහා භාණ්ඩාගාර පරිපූරක **(Supplementary)** මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, එම ප්‍රතිපාදන එකතුව රු.3,365,000,000න් (එක වැය විෂයක සියයට 100 ඇතුළත්ව) උපයෝජනය නොකර රු.2,785,686,782ක් ඉතිරි කර තිබුණි. එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 82ක ඉතිරියක් විය. | පොදු අධ්‍යාපන නවීකරන ව්‍යාපෘතිය සම්බන්ධව පැන නැගුනු ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන් නොවීය. 2021 මාර්තු මාසයේදී ගැටළු නිරාකරණය කර ගත්තද සංචරණ සීමා පැනවූ බැවින් ඇතිවූ අයහපත් තත්ත්වයන් යටතේ සැලසුම් කල පරිදි කාර්යයන් ඉටු නොවීමද ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය. | -එම- |

**(ආ) ඇස්තමේන්තු සකස් කිරීම**

| | | |
|---|---|---|
| අමාත්‍යාංශය වියදම් ඇස්තමේන්තුව සකස් කිරිමේදී මු.රෙ.50 මගින් අවධාරණය කර ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කර නොමැති බව මුලික ඇස්තමේන්තුව හා සංශෝධිත | අමාත්‍යාංශයේ ඇස්තමේන්තු සකස් කිරීමේ දී මු.රෙ. 50හි විධිවිධානයන්ට අනුකූලව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙළ කර ඇත.එසේ වුව ද විවිධ හේතු මත, ඇතැම් වැය විෂයන්ගේ | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තු අතර විශාල විචල්‍යතාවයන් පැවතීමෙන් නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන ඉතිරිවීමත්, ඇතැම් වැය විෂයන්ට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් සිදු වූ බැවින්, සීමිත ප්‍රතිපාදන මනාව කළමණාකරණය කිරීමේ අරමුණින් එම ඉතිරිවීම්,ප්‍රතිපාදන හිඟව පවතින වැය විෂයන්ට මු.රෙ.66ට අනුකූලව මාරු කර ඇත. | |
| (ඇ) | **ප්‍රාග්ධන මාරුකිරීම්**<br>මුදල් රෙගුලාසි 1 පරිශිෂ්ඨය ප්‍රමිත කරන ලද වැය සම්මතය යටතේ දක්වා ඇති වර්ගීකරණය අනුව 2202 වැය ශීර්ෂයන් ලාභ ලැබීම් පෙරදැරි කර නොගත් රජයේ ආයතන වලට ප්‍රාග්ධන මාරු කිරීම් ලෙස කල හැකිව තිබියදී, පළාත් පාලන ආයතනවල කරන ලද සංවර්ධන කාර්යයන් අමාත්‍යාංශයේ අධික්ෂණය යටතේ ගෙවීම් සිදු කර වියදම් ප්‍රාග්ධන මාරුකිරීම් යටතේ දක්වා තිබුණි. පුස්තකාල සංවර්ධනය, වෙළඳ මධ්‍යස්ථාන සංවර්ධනය, මාර්ග ප්‍රතිසංස්කරණය යටතේ වූ වියදම් රු.157,842,515 ක් ප්‍රාග්ධන මාරුකිරීම් ලෙස දක්වා තිබුණි. | අදාල ප්‍රතිපාදන ඉහත පරිදි ප්‍රාග්ධන මාරුකිරීම් යටතේ වෙන් වුව ද, පළාත් සභා හෝ පළාත් පාලන ආයතන වෙත එම ප්‍රතිපාදන ඍජුව මාරු කිරීමට හැකියාවක් නැත. මන් ද, ප්‍රතිපාදන මාරු කළහොත් එම ආයතනවලට අදාළ වියදම් ගිණුම්ගත කිරීමට හැකියාවක් නොමැති බැවිණි. ඒ අනුව අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ එම මුදල් වැය කරනු ලැබේ. | මුදල් රෙගුලාසි මගින් පෙන්වා දී ඇති ආකාරයට කටයුතු පවත්වාගෙන යා යුතුය |
| (ඇ) | අංක 21/1596 /304/134 හා 2021 අගෝස්තු 28 දිනැති කැබිනට් තීරණය අනුව, රටේ පවතින තත්වය තුල වියදම් පාලනය සඳහා රාජ්‍ය වියදම් අවුරා තැබීම වෙනුවට අමාත්‍යාංශවල වියදම් නැවත සමාලෝචනයට ලක් කිරීම මගින් වියදම් සීමා කරගැනීමට කටයුතු කිරීම වඩාත් ඵලදායී කර ගැනීම සඳහා නියමිත අනුමැතීන් යටතේ ප්‍රතිපාදන වෙන් වී තිබුණද දැනට ආරම්භකර නොමැති ඉදිකිරීම්, මිල දී ගැනීම්, ගොඩනැගිලි නවීකරණය හා වැඩිදියුණු කිරීම් තාවකාලිකව අත්හිටුවීමට තීරණය කර තිබුණි.නමුත් එම ලිපිය නිකුත් වීමෙන් පසුවද, රු.මිලියන 1,125ක් සඳහා ව්‍යාපෘති ආරම්භ කර තිබුණු අතර, මේවා තව දුරටත් බැඳීම් වශයෙන් පවතී. | 2021.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ IIඡේදය අනුව රජයේ නව සංවර්ධන ප්‍රවේශය යටතේ ආරම්භකර ඇති සංවර්ධන වැඩසටහන් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජිත ක්‍රියාමාර්ග අදාළ කර නොගන්නා ලෙස සඳහන් කර ඇත.<br>. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කර භාණ්ඩාගාර මූල්‍ය පාලනයට සහාය විය යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය පරිදි විධිමත් පරිදි ලබා ගන්නා ලද භාණ්ඩ සහ සේවා සඳහා සහ සම්පූර්ණ කර වැඩ සහතික කර ඇති කොන්ත්‍රාත් සඳහා තවදුරටත් ගෙවිය යුතු වටිනාකම බැරකම් ලෙස දැක්විය යුතු වුවත් එලෙස නොදක්වා බැඳීම් ලෙස සටහන් කළ අවස්ථා නිරීක්ෂණය විය. එලෙස දැක්වූ ව්‍යාපෘති 04 ක එකතු වටිනාකම රු.12,338,519ක් විය. | බැඳීම් හා බැරකම් ලේඛනය පිළියෙල කිරීමේදී අදාළ වවුචර් පරීක්ෂා කර ගෙවීමට සූදානම්ව පැවති වවුචර් පමණක් බැරකම් ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වුවද ඉදිරියේදී වඩාත් සැලකිල්ලෙන් බැරකම් හා බැඳීම් හඳුනාගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | නැගී එන කලාපවල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියෙන් අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලද වාහන 10 සඳහා තවදුරටත් ගෙවීමට බැඳී ඇති කල්බදු වටිනාකම වන රු.65,573,680 බැඳීම් ලේඛනයේ දක්වා නොතිබුණි. | එම මුදල බැඳීම් ලේඛනයට ඇතුලත් කර 2022 වර්ෂයේදී නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

## 2.3 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මු.රෙ. 571 ප්‍රකාරව වර්ෂ 02 වැඩි තැන්පතු ආදායම් ගිණුමට බැර කළයුතු නමුත් වර්ෂ 2 ට වැඩි තැන්පතු 136 ක වටිනාකම රුපියල් 63,126,232 ක් ආදායම් ගිණුමට බැර කර නොතිබුණි. | වර්ෂ දෙකකට වැඩි තැන්පතු තුළ ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ, කොන්ත්‍රාත් බිල්වලින් අඩු කර ගන්නා ලද සියයට 10ක රැඳවුම් මුදල් වන අතර, මෙම මුදල් නිදහස් කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරුන් මඟින් අදාල ඉල්ලීම් ඉදිරිපත් විය යුතුව ඇති බැවින් එම ක්‍රියාවලිය සඳහා තරමක කාලයක් ගතවේ. කෙසේ වුව ද මේ වනවිට කාලය ඉක්ම වූ තැන්පතු සියල්ල රජයේ ආදායමට | මුදල් රෙගුලාසි 571(3) විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

බැර කරන බව දැනුම් දී ඇති බැවින් අදාළ ඉල්ලීම් ඉදිරිපත් නොකරන සියල්ල රජයේ ආදායමට බැර කිරීමට පියවර ගෙන ඇත.

## 2.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 446 සඳහන් විධිවිධාන ප්‍රකාරව සුළු මුදල් පොත පවත්වා නොතිබුණි | ඉදිරියේ දී පවත්වා ගැනීමට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි 446(3) ප්‍රකාරව සුළු මුදල් අග්‍රිමයවෙනුවෙන් පමණක් ලැබුණු මුදල් සහ එයින් කරන ලද ගෙවීම සුළු මුදල් පොතේ සටහන් කළ යුතුය. |
| (ආ) | රාජකාරී දුරකථන ලේඛනයක් පවත්වා තිබුණද, මුදල් රෙගුලාසි 845(1) 26 පරිශිෂ්ඨයේ ආකෘතියට අනුව ලේඛනය පවත්වා නොතිබුණි. | නියමිත පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 845(1) 26 පරිශිෂ්ඨයේ ආකෘතියට අනුව ලේඛනය පවත්වා ගත යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පවත්වා තිබුණද යාවත්කාලීන කර නොතිබුණි. | යාවත් කාලීන කිරීම සිදු කරමින් පවතී | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලි වල සියලුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛණ පොතක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශයේ ප්‍රකාරව කමිටුවේ ලේකම් වරයා විසින් තාක්ෂණික කමිටුවේ ලේඛනයක් පවත්වා ගතයුතු වුවද එසේ කර නොතිබුණි. | සියළුම තාක්ෂණික හා ඇගයීම් කමිටුවල පැමිණීම සම්බන්ධව ලේඛනයක් නඩත්තු කිරීමට පියවර ගන්නා ලදි. | විධිවිධාන ප්‍රකාරව කමිටුවේ ලේකම් වරයා විසින් තාක්ෂණික කමිටුවේ ලේඛනයක් පවත්වා ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඉ)** | විගණන විමසුම් ලේඛනය. යාවත්කාලීන කර නොතිබුණි.. | විධිමත්ව හා යාවත් කාලීන කිරීම සිදු කර ඇත | මුදල් රෙගුලාසි 452(1) ප්‍රකාර විගණන විමසුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. |
| **(ඊ)** | මු.රෙ 1647(ඉ) සහ මු.රෙ 802 අනුකූලව වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | යාවත් කාලීන කිරීම සිදු කර ඇත. | මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛණයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

## 2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණක මගින් පවතින අභ්‍යන්තර පාලන පද්ධති නැවත සමාලෝචනය කර වරින්වර අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම හා යාවත්කාලීන කිරීම් සිදු කරනු ලබයි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාව ඉටු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයේ උපදෙස් පරිදි අමාත්‍යාංශයේ නිලධාරින්ට වෙන් කළ වාහන හැර අනෙකුත් සියළුම වාහන වල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වුවද,එසේ කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ලාංඡනය නොමැති වාහනවල එය මුද්‍රණය කරනු ලැබේ.රාජ්‍ය දේපල වල ආරක්ෂාව සඳහා මෙම ලාංඡන 2022 මැයි 09 සිට තාවකාලිකව ඉවත්කිරීම සිදුකර ඇත. නැවත යථා පරිදි ඒවා ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 26/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය. | ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | පැවති කොවිඩ් වසංගත තත්වය හා දැනට පවතින ඉන්ධන අර්බුදය මත ඉන්ධන දහනය පරික්ෂාව සිදුකිරීම ප්‍රයෝගික තත්වයන් යටතේ අපහසු වී ඇත.කෙසේ වෙතත් ඉන්ධන අර්බුදය යථාතත්වයට පත් වූ වහාම ඉන්ධන දහනය පරික්ෂාව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 පෙබරවාරි 05 දිනැති, අංක 01/2018 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ අනු අංක 1.12 | සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර ලබා දීමේදී චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව නියමිත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට පමණක් මෝටර් රථ ආනයන බලපත්‍ර ලබා දිය යුතු වුවද පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත සහ පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත රජයේ සංවර්ධන ව්‍යාපෘතිවල වසර 9ක සේවා කාලයක් සම්පූර්ණ නොකර මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කර තිබුණි. | පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා වසර 9ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවට ලේඛන පරීක්ෂා කිරීමෙන් තහවුරු කරගෙන ඇත. 1/2018 චක්‍රලේඛයේ 1.1 හා 1.12 අනුව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත.<br>පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකවරයා සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගෙන් උපදෙස් විමසා ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 පෙබරවාරි 05 දිනැති අංක 01/2018 දරන වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 9.2 ඡේදය | චක්‍රලේඛයේ 9.2 ඡේදය අනුව සුදුසුකම් ලබන නිලධාරින් සඳහා පමණක් මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීම සෑම ලේකම්වරයකුගේ ම වගකීම වන බව සඳහන් වුව ද ඉහත නිරීක්ෂණ අනුව ලේකම්වරයා විසින් වගකීම ඉටුවන ආකාරයට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | අංක 01/2013 හා 2013 අගෝස්තු 02 දරන වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 01.02 (iv) | පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු හා අනුකූලතා නිලධාරි වශයෙන් සේවය කරන නිලධාරියාගේ ව්‍යාපෘති සේවා කාලය සම්පූර්ණ වී තිබුණ ද මෙම චක්‍රලේඛයේ 01.02 (iv) ඡේදය අනුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් | අදහස් දක්වා නොමැත | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගෙන් උපදෙස් විමසා ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පසුව කොන්ත්‍රාත් පදනම මත මෙම චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් ලබන තනතුරක් සඳහා පත් කර ඇති නිලධාරීන්ට සහනදායී පදනමට මෝටර් රථ ආනයන බලපත්‍ර හිමි නැති බවට උපදෙස් ලබා දී තිබියදී මෝටර් රථ ආනයන බලපත්‍රයක් ලබා දී තිබුණි. | | |

## 2.7 අවිධිමත් ගනුදෙනු

---------------------

**(අ)** <u>ජංගම වෙළඳකුටි මිලදී ගැනීම</u>

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන මට්ටමින් බෙදා දීම සඳහා ජංගම වෙළඳකුටි 90ක් මිලදී ගැනීම සඳහා ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීම යටතේ ආයතන දෙකකින් මිල ගණන් ලැබී තිබුණි. අවම මිල ගණන් ඉදිරිපත් කළ පුද්ගලික ආයතනයෙන් ජංගම වෙළඳකුටි වර්ග දෙක පිළිවෙලින් රු.295,000ක් සහ රු.260,000ක් බැගින් වෙළඳකුටි 90ක් රු.24,945,000කට මිලදී ගැනීමට තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරුනි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර පිරිවැය ප්‍රතිලාභ විග්‍රහයක් සිදුකර නොතිබුණ අතර ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේදය පැහැදිලිව හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | අමාත්‍ය මණ්ඩල උපදෙස් පරිදි විචක්ෂණශීලිව රාජ්‍ය වියදම් කළමනාකරණය කල යුතුය. |
| **(ii)** | වැය විෂය අංක 420-2-3-24-2202 පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම යටතේ වියදම් දැරීම සඳහා වූ ව්‍යාපෘති ක්ෂේත්‍ර යටතට නොවැටෙන ජංගම වෙළඳකුටි සඳහා වියදම් දැරීම 2-2021 පළාත් පාලන මාර්ගෝපදේශයට පටහැනි වන අතර 2021 අගෝස්තු 28 දිනැති අංක 21/1596/304/134 දරනඅමාත්‍ය මණ්ඩල තීරණයටද පටහැනි වේ. හදිසි හා අත්‍යාවශ්‍ය අවශ්‍යතා මත මාර්ගෝපදේශවලට පරිබාහිරව එවැනි ව්‍යාපෘති අනුමත කිරීමේ බලය මත ලේකම්වරයා මෙම ව්‍යාපෘති අනුමත කර | අදහස් දක්වා නොමැත | අමාත්‍ය මණ්ඩල උපදෙස් පරිදි විචක්ෂණශීලිව රාජ්‍ය වියදම් කළමනාකරණය කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ හදිසි හා අත්‍යාවශ්‍ය අවශ්‍යතාවය ජංගම වෙළඳකුටි ලබා ගැනීම නොවන බව නිරීක්ෂණය විය. | | |
| **(iii)** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන බල ප්‍රදේශ පමණක් තෝරා ගැනීමට බලපාන හේතු විගණනයට ඉදිරිපත් නොවුනි. | අදහස් දක්වා නොමැත | -එම- |

**(ආ)** <u>ඊ පළාත් පාලනය</u>

| | | |
|---|---|---|
| විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ප්‍රසම්පාදන තීරණයක් ගෙන මුදල් රෙගුලාසි 137 (1), (2),(3),(4) හා 138 හි විධිවිධාන පිළිබඳ සැලකිල්ලක් නොදක්වා ඊ පළාත් පාලනය පරිගණක පද්ධතියේ සහායක හා නඩත්තු සේවා සඳහා පුද්ගලික සමාගමකට 2018 වර්ෂයේදී රු.මිලියන 9.6 ක් ගෙවා තිබුණු අතර 2019 වර්ෂය ආරම්භ වන විටත් එම ව්‍යාපෘතිය අකර්මන්‍යව පැවතිණි. ඒබව අමාත්‍යාංශයද පිළිගෙන ඇති අතර මේ සඳහා වැයවූ මුදල් නිශ්කර්ය බවට පත්වී තිබුණි. | **eLG (1)** ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ගැටළු වලට විසඳුමක් ලෙස **eLG (2)** නමින් ව්‍යාපෘතියක් ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය සමග එක්ව ක්‍රියාත්මක කිරීමට යෝජිතය. | වියදම් අනුමත කිරීමේදී හා සහතික කිරීමේදී සිදු වී ඇති නොසැලකිලිමත් බව සම්බන්ධව විධිමත් පරිදි ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 සැලැසුම් කිරීම**

-------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | ---------------------- | ----------- |
| **(අ)** | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අනුමත අයවැය ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීම පෙරදැරි කරගෙන ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවද, අපේක්ෂිත කාර්යයන් නිශ්චිතව සඳහන් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමේදී අමාත්‍යාංශයේ එක් එක් අංශවලට අදාළ නිශ්චිත කාර්යයන් සහ අයවැය ඇස්තමේන්තු සැළකිල්ලට ගනු ලැබේ. එහිදී 2020.12.23 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 07/2020 හි සඳහන් උපදෙස් අනුගමනය කර ඇත. | සමාලෝචිත වර්ෂයට පසු වර්ෂවල සැලසුම් සාර්ථක කර ගැනීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය විද්‍යුත් පුස්තකාල ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය හා පළාත් පාලන ආයතන සඳහා ජංගම වෙළඳකුටි ලබා දීමේ වැඩසටහන වැනි අයවැය යෝජනා මඟින් හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. | සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම විධිමත් පරිදි සකස් කිරීමට පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදි. | රජයේ ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවර්ධන අංශයට අදාල ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් නිශ්චිතව ක්‍රියාකාරී සැලසුමේ දක්වා නොතිබීම හේතුවෙන් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘතිවල ප්‍රගතිය හඳුනා ගත නොහැකි විය. | සංවර්ධන අංශයට අදාළ අපේක්ෂිත කාර්යන් ක්‍රියාකාරී සැලැස්මේ නිශ්චිතව දැක්වීමට සටහන් කර ගතිමි. | නිවැරදි ක්‍රියාකාරී සැලැස්මක් මෙන්ම ඊට එරෙහිව ප්‍රගති වාර්තාවක් ද සකස් කළ යුතුය. |

**3.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොම්පෝස්ට් යන්ත්‍ර 09ක් මිලදී ගැනීම සඳහා 2017 වර්ෂයේ දී රු.මි.935.69ක් වැයකර තිබූ අතර එම යන්ත්‍ර ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිලි ඉදි කිරීමට පසුගිය වර්ෂවලදී රු.මි.631.23ක් වැය කර තිබුණි. එසේ වුවද ගාල්ල මහනගර සභාව වෙනුවෙන් ස්ථාපිත කළ යන්ත්‍රය 2022 ජූලි 31 දින දක්වා භාවිතයට ගැනීම ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය විධිමත් පරිදි 2022.02.24 දින ගාල්ල මහා නගර සභාව වෙත භාර දී ඇති අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු කඩිනමින් ආරම්භ කරන ලෙස එම නගර සභාව වෙත දන්වා ඇත.<br>මෙම ව්‍යාපෘති භූමියට ගාල්ල මහා නගර සභාව විසින් දිනපතා | ගිවිසුම්ගත කාල පරිච්ඡේදය තුළ ඉදිකිරීම් නිමකරවා ගැනීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු විය යුතුය. |

| | | |
|---|---|---|
| | කසල බැහැර කරන බැවින් මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට බාධා සිදුව ඇති බව නිරීක්ෂණය කරමි. | |

**3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

**-------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ----------------------- | -------------------------------------- | --------------- |
| **(අ)** 2017 වර්ෂයේ මිලදී ගත් කොම්පොස්ට් යන්ත්‍ර අතරින් කෑගල්ල, , හම්බන්තොට සහ කාත්තාන්කුඩි යන නගර සභා සහ ලංකාපුර, වඩමාරච්චි හා අඩලච්චේන ප්‍රාදේශීය සභා යටතේ ස්ථාපිත කර ඇති යන්ත්‍ර සඳහා දෛනිකව ලැබෙන කසල ප්‍රමාණය අපේක්ෂිත කසල ප්‍රමාණයෙන් සියයට 10කට වඩා අඩු ප්‍රතිශතයක පැවති බැවින් දෛනික නිෂ්පාදනයද සියයට 10කට වඩා අඩුවිය. ඒ අනුව අපේක්ෂිත ප්‍රතිලාභ අහිමි වීමෙන් යෙදවූ මුදලට සාපේක්ෂව නිශ්කාර්ය ව්‍යාපෘතියක් බව නිරීක්ෂණය විය. | රටේ පවතින තත්ත්වය මෙයට ඉවහල් වී ඇති අතර කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් දිරන කසල නිවාස තුලම කොම්පෝස්ට් කිරීම ඉහල ගොස් ඇත. සියලු තත්ත්වයන් ප්‍රශස්ත මට්ටමින් පවති නම් අපේක්ෂිත ඉලක්කයන් ළගා කර ගත හැකි වේ | කැබිනට් මණ්ඩලයට නිවැරදි නොවන තොරතුරු ඉදිරිපත් කර යන්ත්‍ර මිලදී ගැනීම සඳහා තීරණය ගනු ලැබූ පාර්ශවයන් සම්බන්ධව විධිමත් පියවර ගත යුතු වීම. |
| **(ආ)** දඹුල්ල මහ නගර සභාවේ ස්ථාපිත කොම්පෝස්ට් යන්ත්‍රය උපරිම ධාරිතාවයට ලගා වී ඇති බවට වාර්තා කළ ද එම යන්ත්‍රයේ මාසික සාමාන්‍ය **අලෙවි ආදායම** රු. ලක්ෂ 4ක් විය මෙම යන්ත්‍රයකින් වර්ෂයකට **අපේක්ෂිත ලාභය** රු. මිලියන 80ක් වන බැවින් අපේක්ෂිත මූල්‍ය ඉලක්කයන් සපුරාගත නොහැකි වන බව විගණනයේදී තහවුරු විය. | පාලනය කළ නොහැකි සාධක උද්ගත වීමෙන් අපේක්ෂිත පොහොර සංචිතයක් ලබා ගැනීමට නොහැකි වීම නිසා රුපියල් මිලියන 80 ක මූල්‍ය ප්‍රගතියක් ලගා කර ගැනීම මෙම අවස්ථාවේදී අපහසු වන නමුත්, විධිමත් පරිදි පළාත් පාලන ආයතන නැවත දැනුවත් කර කසල ලබා ගැනීම විධිමත් කිරීමෙන් අපේක්ෂිත නිමැවුම ලභාකර ගැනීමට පළාත් පාලන ආයතන දැනුවත් කර ඇත. | -එම- |

**3.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බෙලිඅත්ත නාගරික පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා අත්තිකාරම් මුදලක් ලෙස 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට රු.මිලියන 68 ක් ගෙවා තිබූ නමුත් කිසිදු ඉදිකිරීමක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | 2014 වර්ෂයේ සිදු වූ දේශපාලන වෙනස් වීම මත 2014 වසරින් පසු ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොමැති වුවත් සංස්ථාව ඉටුකරන ලද කාර්යයන්ට අදාළව රු.මිලියන 1.1ක් වූ බිල්පත ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සහතික කර නැත. ඉතිරි මුදල වූ රු.මිලියන 66.8ක් තවදුරටත් අයකර ගත යුතුව ඇත. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වූ ගබඩාව වෙනුවෙන් සංස්ථාවෙන් බදු පදනම මත ලබාගෙන ඇති රු.මිලියන 25.95 හිලව් කිරීමට ද තීරණය කර ඇත. | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු වීම. |

**3.6 විදේශ ආධාර ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) **පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM)**<br>උපදේශකයින් සේවයේ නියතු කරගැනීම සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5 (i), 4.3 සහ 4.4 ඡේදවල සඳහන් විධිවිධාන වලට පටහැනිව තෝරාගත් උපදේශකවරුන් සඳහා 2021 වර්ෂයේදී රු.8,110,000ක වැටුප් ගෙවා තිබූ අතර, බඳවා ගත් උපදේශකයින්ගෙන් ව්‍යාපෘතියට අදාලව ප්‍රමාණවත් සේවයක් ඉටුකළ බව විගණනයේදී තහවුරු නොවීය. | උපදේශකයින් බඳවා ගැනීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධි විධානවලට පටහැනිව කටයුතු කර නොමැති බව දැන්වීමට කැමැත්තෙමි. අත්‍යවශ්‍ය අවස්ථාවේ දී මෙම නිලධාරීන්ගෙන් ගෙවූ මුදලට සාපේක්ෂව විශාල සේවයක් ලබාගත් බව සඳහන් කරමි. | අනවශ්‍ය ලෙස පවත්වාගෙන යන තනතුරු අහෝසි කොට රජයේ වියදම් අඩු කිරීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | **ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)** | | |
| **i.** | ව්‍යාපෘතියේ තෙවන ගිණුම් වර්ෂය වූ 2021 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.මිලියන 2739.9ක් වෙන් කර තිබුණ ද වර්ෂයට අදාල වියදම රු.මිලියන 718.01ක් පමණක් වීමෙන් වර්ෂය තුළ සියයට 26.2ක තරම් ඉතා දුර්වල මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇති බව නිරීක්ෂණය විය. | රටේ පැවති අයහපත් තත්වය හා වෙළඳපොලේ පැවති ආනයනයන්හි මිල විචලනයන් හේතු කොට ගෙන කොන්ත්‍රාත් කරුවන් විසින් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් නිසි කාල පරිච්ඡේදයේ දී අවසන් නොකිරීම හේතු කොට ගෙන සැළසුම් කළ පරිදි ප්‍රගතිය අත් කර ගැනීමට නොහැකි විය. | ව්‍යාපෘතිය නියමිත කාලය තුල අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| **ii.** | මෙම ව්‍යාපෘතියේ ප්‍රාරම්භක කටයුතු සඳහා පත් කළ උපදේශකවරුන් 4 දෙනෙකු විසින් ඉටුකළ යුතු කාර්යයන් නිම කර නොමැති වීමෙන් ගෙවන ලද රු.මිලියන 6.47ක මුදලක් නිශ්කාර්ය වියදමක් වී තිබූ බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ ප්‍රාරම්භක අවධියේ දී බඳවාගත් උපදේශකවරුන් ලබා දුන් වාර්තා හා වර්තමානය වන විට ඔවුන් විසින් ලබා දෙන ලද තොරතුරු හා වාර්තා ව්‍යාපෘතියේ කටයුතු සඳහා මේ වන විට සක්‍රීය ලෙස දායක කර ගනු ලබන අතර,අදාළ උපදේශකවරුන් සම්බන්ධ විශේෂ කමිටුවක් පත්කර ඔවුන් විසින් සිදු කරන ලද කාර්යභාර්ය ඇගයීමට ලක්කර එහි වාර්තාවක් මේ වනවිට විගණනය වෙතද ඉදිරිපත් කර ඇත. | රජයට පාඩුවක් නොවන ලෙස, ගෙවන ලද මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | **යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රාරම්භක පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය (UPPF)** | | |
| **i.** | මාර්ගගතව පැවති ද්විතීය නගර තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය එම ලැයිස්තුවෙන් ඉවත් කර තිබුණි. ඒ හේතුවෙන් අවසන් කෙරුනු එම ව්‍යාපෘතියේ ප්‍රාරම්භක කටයුතු වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද නාගරික ව්‍යාපෘති පහසුකම් සැලසුම් ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබුණි. ව්‍යාපෘතිය අවසන් කිරීම හේතුවෙන් රජයට සිදුවූ පාඩුව රු.මිලියන 169.06ක මුදල පාඩුවක් නොවී ප්‍රයෝජනවත් | රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත ව්‍යාපෘතියේ කටයුතු අවසන් කළ ද උපදේශක සමාගම මගින් ලබාගත් සේවය සඳහා කාල පදනම **(Time Base)** මත ගෙවීම් සිදුකර ඇත. රජයට උපරිම ආර්ථික වාසියක් ලැබෙන ආකාරයට අවම පිරිවැයකින් උපදේශක සමාගමේ සේවය ලබා | රජයට පාඩුවක් නොවන සේ ව්‍යාපෘති කටයුතු සිදු කල යුතු අතර පාඩුවක් සිදු වී ඇත්නම් එයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | වියදමක් බවට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් වියදම අවම කර ගනිමින් රජයට උපරිම ආර්ථික වාසියක් ලබා දීමට කටයුතු කර තිබුණි. | |
| **ii.** | ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට වැටුප් ගෙවීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019 මාර්තු 05 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන අනුව පිහිටවිය යුතු වැටුප් තලයේ නොපිහිටුවා මාසයකට රු.60,000ක් වැඩියෙන් මාස 16ක් සඳහා රු.960,000ක් වැඩිපුර ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2022.02.07 දිනැතිව ලබා දී ඇති නිර්දේශය වෙනස් කර ගැනීම සඳහා මාගේ අංක **PL/16/**06/21 හා 2022.06.20 දිනැති ලිපිය භාණ්ඩාගාර ලේකම් වෙත යොමු කර ඇති බව දන්වමි. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **iii.** | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019 මාර්තු 05 දිනැති චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව පුරනැගුම ව්‍යාපෘතියේ මූල්‍ය විශ්ලේෂකවරයා මෙම ව්‍යාපෘතියේ ගණකාධිකාරීවරයා ලෙස වැඩ බැලීමේ පදනම යටතේ පත්කර වැටුප් ලෙස රු.720,000ක් ගෙවා තිබුණි. එසේ නීති රීති රෙගුලාසිවලට පටහැනිව ගෙවන ලද වැටුප් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | වැරදි ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | **පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) – අතිරේක ප්‍රතිපාදන** (LGESP-AF) | | |
| | 2016 නොවැම්බර් 02 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අත්සන් කළ අංක 3431-**SRI(SF)** දරන ණය ගිවිසුම අනුව මෙම ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහය අනුව මුල් මාස 18 තුළ ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිනැමීමට හා පිරිනැමූ කොන්ත්‍රාත් එකී ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළ වැඩ අවසන් කරවා ගැනීමට නොහැකි වීම නිසා 2023 මාර්තු 31 දින දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කරවාගෙන තිබුණි.<br>දින දීර්ඝ කිරීම හේතුවෙන් උපදේශක සමාගම් හා ව්‍යාපෘති කාර්යමණ්ඩල පවත්වා | අවශ්‍ය මුදල් ප්‍රතිපාදන නොලැබීම, කොවිඩ් වසංගතයේ බලපෑම සහ රජය විසින් පනවන ලද ආනයන සීමාවන් හේතුකොට ගෙන ඉදිකිරීම් ද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වීම, ව්‍යාපෘති කාලය දීර්ඝ කර ගැනීමට හේතු විය. | චක්‍රලේඛ උපදෙස් පරිදි ව්‍යාපෘති කාර්යාල වසා දමා අමාත්‍යාංශයේ සහ පළාත් සභාවල සේවයේ නියුතු නිලධාරීන්ගේ දායකත්වයෙන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැනීම ඇතුළත් ව්‍යාපෘති මෙහෙයුම් වියදම සඳහා මසකට රු.මිලියන 80 බැගින් රු.මිලියන 3,120ක අමතර වියදමක් රජයට දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය. | | |
| (ඉ) | **නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)**<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් 2017 ජූලි 17 දින අත්සන් කරන ලද ණය ගිවිසුම අනුව මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් 4ක පානීය ජලය, වාරිමාර්ග, ග්‍රාමීය මාර්ග ආදී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ජපන් යෙන් මිලියන 12,957ක ණය මුදලක් ලබා දීමට නියමිත විය. ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහය අනුව උප ව්‍යාපෘතිවල සියලු ඉදිකිරීම් 2021 සැප්තැම්බර් වන විට අවසන් කර ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කළ යුතු විය. ව්‍යාපෘති කාර්යසංග්‍රහය අනුව උපව්‍යාපෘති 418ක් අවසන් කළ යුතු වුවත් උප ව්‍යාපෘති 355ක් පමණක් ක්‍රියාත්මක කිරීමට තෝරාගෙන තිබුණු අතර එයින් ද උපව්‍යාපෘති 232ක් කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ සැලසුම් නිර්මාණ හා ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශක සමාගම් දෙකක් පත්කරගෙන ඇති අතර එම සමාගම්වලින් අපේක්ෂිත ප්‍රගතිය අත්කර ගැනීමට අසමත්ව තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහය අනුව 2021 වර්ෂය අවසන් වන විට උපයෝජනය කළ යුතු මුදල ජපන් යෙන් මිලියන 12,492ක් වුවත් උපයෝජිත මුදල ජපන් යෙන් මිලියන 643.33ක් වීමෙන්, සියයට 7.39ක ප්‍රගතියක් පමණක් ළඟා කරගෙන ඇති බවත් ඒ අනුව ව්‍යාපෘතිය ඉතා දුර්වල ක්‍රියාකාරී මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය. | ව්‍යාපෘති කාර්ය සංග්‍රහය සහ ණය ගිවිසුම අනුව ව්‍යාපෘති කාලය වසර 07කි.ණය ගිවිසුම අත්සන් කරන ලද්දේ 2017.07.07 වන අතර, ඒ අනුව ව්‍යාපෘතිය අවසන් කළයුතු වන්නේ ඉන් වසර 07 කට පසුව එනම් 2024.07.07 දිනදීය.<br>ව්‍යාපෘතිය සඳහා පත්කළ උපදේශක සමාගම් 02, පිළිවෙළින් 2019 ජූලි සහ 2019 සැප්තැම්බර් මාසවල වැඩ ආරම්භ කොට ඇත. ඒ අනුව මාස 48 කට පසුව එනම් 2023 ජූලි මස පානීය ජල ව්‍යාපෘති හා 2023 සැප්තැම්බර් මස මාර්ග හා වාරිමාර්ග ඉදි කිරීම් අවසන් කළ යුතුවේ. | අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟා කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | **පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (PRDP)** | | |
| | ලෝක බැංකුවේ අන්තර්ජාතික සංවර්ධන ආයතනය සමඟ ශ්‍රී ලංකා රජය 2017 සැප්තැම්බර් 29 දින එළඹි අංක 5788-**LK** දරන ණය ගිවිසුමෙහි අරමුණ වෙනස්කර ප්‍රතිව්‍යුහගතකරණය කරනු ලැබීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතියේ පළාත් මාර්ග සංරචකය යටතේ පළාත් 09හි ප්‍රාදේශීය මාර්ග ඉදිකිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ඇ.එ.ජ.ඩොලර් මිලියන 109ක ණය මුදලක් ලබා දීමට නියමිත විය. ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහය අනුව එම සියළු ඉදිකිරීම් 2023 මාර්තු වන විට අවසන් කළ යුතු විය.ව්‍යාපෘති කාර්යසංග්‍රහය අනුව අදියර **ii** පියවර **ii** යටතේ වන මාර්ග පැකේජ ප්‍රසම්පාදන කටයුතු 2019 දෙසැම්බර් 31 දින වන විට අවසන් කළ යුතු වුවද 2021 දෙසැම්බර් 31 වන විටද එවැනි ප්‍රගතියක් අත්කර ගැනීමට අසමත්ව තිබුණු අතර අදියර **i** යටතේ ප්‍රධානය කළ මාර්ග පැකේජ ප්‍රගතියද දුර්වල මට්ටමක පැවතුණි. | සිවිල් වැඩ සඳහා වෙන් කරන ලද ඩොලර් මිලියන 70න් සැලකිය යුතු ඉතිරියක් නොමැති වූ බැවින් ඉදිරි පැකේජ ක්‍රියාත්මක කිරීමට ලෝක බැංකුව අවසර නොදෙන ලදි. ඒ අනුව එම පැකේජ වල සම්පූර්ණ භෞතික ප්‍රගතිය 55% ක් අත්කරගෙන ඇති අතර (අපේක්ෂිත ඉලක්කගත ප්‍රගතිය 60%) 40% ක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කරයි. | නියමිත කාලය තුළ ව්‍යාපෘතියේ නියමිත කාර්යසාධන මට්ටම පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | **ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය** | | |
| | **i.** එක්සත් රාජධානිය**,** නෙදර්ලන්තය ආදී රටවල පෞද්ගලික බැංකුවලින් එකී රටවල අපනයනය සංවර්ධනය කිරීමේ ණය ලෙස ලබා දී ඇති ණය මුදල් භාවිතයෙන් ඉදිකෙරෙන පාලම් සඳහා ස්ථාන තෝරා ගැනීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් නොපැවති අතර ව්‍යාපෘති කාර්යමණ්ඩලයක් පැවතිය ද ඒකාබද්ධිත විශාල ප්‍රමාණයේ කොන්ත්‍රාත් (**Turn Key**) ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොතිබුණි. | නව පාලම් ස්ථාන තෝරා ගැනීමේදී පැහැදිලි ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබයි. එම ක්‍රමවේදයේ මූලික පියවර ලෙස නව පාලම් ස්ථාන තෝරා ගැනීමේ නිර්ණායක හා ශක්‍යතා අධ්‍යයන අනුසාරයෙන් ඒකාබද්ධ ස්ථාන පරීක්ෂණයක් තුළින් ස්ථානීය ශක්‍යතාවය අධ්‍යනයට ලක් කරනු ලබයි. | කළමනාකාරීවයේ පැහැදිලි කිරීම ක්‍රියාවට නැංවිය යුතුය. |
| | **ii.** ගිවිසුම අනුව පාලම් සවිකළ යුතු ස්ථාන හඳුනාගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් දියත් කර නොතිබුණු අතර පාලම් ස්ථානගත කළ යුතු ස්ථාන තීරණය කිරීමේදී පාලමක් සඳහා වන පිරිවැය හා එම පාලමෙන් ප්‍රයෝජන ගනු ලබන්නන් සංඛ්‍යාව හා අනාගතයේදී සිදුවිය හැකි වර්ධනයන් සලකා ප්‍රමාණවත් පිරිවැය ප්‍රතිලාභ විග්‍රහයකින් පසුව ස්ථාන තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාලම්වල භෞතික ඉදිකිරීම් සඳහා යොදාගනු ලබන කොන්ක්‍රීට්වල තත්ව සහතිකකරණය BS 1881 - 116 ප්‍රමිතියට සාරාණුකූලව සිදුකරනු ලබයි. | කොන්ක්‍රීට් ඉදිකිරීම් පිළිබඳ තත්ත්ව පරීක්ෂණ ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එසේම වසර 100කට වැඩි කාලයක පැවැත්මක් අපේක්ෂාවෙන් සවිකරනු ලැබුව ද පාලමේ කොන්ක්‍රීට් ඉදිකිරීම පිළිබඳ කිසිදු ප්‍රමිති පාලන කටයුත්තක් සිදුකර නොතිබුණි. | | |
| **iii.** | වානේ පාලමක අවශ්‍යතාවයක් නොමැතිව ආයෝජනය කරන ලද මුදලට සාපේක්ෂව ප්‍රතිලාභයක් හිමි නොවන මෙන් ම බෝක්කු ඉදි කළ යුතු ස්ථානවල විශාල ප්‍රමාණයේ පාලම් ඉදිකර ඇති අවස්ථා නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. | පාලමක් ඉදිකළයුතු ඇතැම් ස්ථානවල විවිධ හේතුන් නිසා පාලමක් වෙනුවට කුඩා බෝක්කු හෝ කුඩා පාලම් ඉදිකර තිබිය හැකිය. විශාල පාලමක් ඉදිකළ යුතු ස්ථානවල ඉදිකර ඇති ප්‍රමාණවත් නොවන බෝක්කු හෝ කුඩා පාලම් ඉවත්කර ඒ වෙනුවට නියමිත දිගින් යුතු පාලම් මෙම ව්‍යාපෘතිය යටතේ එවැනි ස්ථානවල ඉදිකිරීමට කටයුතු කර ඇත. ඒ අනුව එම ස්ථාන වල ඇතිවිය හැකි ගංවතුර තත්ත්ව හෝ අනාරක්ෂිත තත්වයන් මග හරවා ගෙන ඇත. | ආයෝජනය කරනු ලබන මුදලට සාපේක්ෂව ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ පිළිබඳ අධ්‍යයනය කර අවශ්‍යතාව මත ස්ථාන තෝරාගත යුතුය. |
| (ඖ) | **මහා කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහන - ණය අංකය 3348/3349 – 2021** | | |
| i. | රු.4,360,779,986 ක වටිනාකමට ඉදිකිරීමට යෝජිත වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමේ කටයුතු 2017 ජුනි 21 දින ආරම්භ කර 2019 දෙසැම්බර් 14 දින වැඩ අවසන් කිරීමට සැලසුම් කර තිබු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ. | අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම අසාර්ථක වීම මත සමස්ත අපජල පද්ධතියම අසාර්ථක වීමේ දැඩි අවදානමක් පවතින බැවින් ගැටළු කඩිනමින් නිරාකරණය කර ගැනීමට කටයුතු කල යුතුය.<br>ව්‍යාපෘතිය<br><br>කඩිනමින් අවසන් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| ii. කිරුළ - නාරාහේන්පිට ප්‍රදේශයේ අපජල පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය 2017 ඔක්තෝම්බර් 23 දින කොන්ත්‍රාත් ප්‍රදානය කර 2020 අප්‍රේල් 10 දින අවසන් කිරිමට සැලසුම් තිබු නමුත් 2022 ජනවාරි 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. තවද 2021 දෙසැම්බර් 31 දින වන විට නැවත පදිංචි කිරිම සහ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු.184,170,150 ක මුදලක් ගෙවා තිබු බව නිරික්ෂණය විය. | ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය සහ සැලසුම් වරින්වර වෙනස්වීම මත මෙම කාල ප්‍රමාදය සිදුවී ඇත. | |
| iii. Provision of New Gravity Sewers, Force Mains and Construction of pump stations for Kirulapone catchment Area. මෙම ව්‍යාපෘතිය 2017 මැයි 18 දින ආරම්භ කර 2020 මැයි 14 අවසන් කිරිමට සැලසුම් කර තිබු නමුත් 2022 ජුලි 30 දක්වා දින දීර්ඝ කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට මුල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 63 ක් හා 53 විය. පොම්ප මධ්‍යස්ථානය ඉදිකිරිම සඳහා වු යෝජිත ඉඩම කොන්ත්‍රාත්කරුට භාරදීමට ප්‍රමාදවීම මත කොන්ත්‍රාත්කරුට දැරිමට සිදුවන අතිරේක පිරිවැය මත කොන්ත්‍රාත්කරු රු.3,071,262,126 ක හිමිකම්පෑමක් සිදුකර තිබුණි. රු.717,054,675 ක් වු කොන්ත්‍රාත්තු පිරිවැය සඳහා මෙම හිමිකම්පෑම සිදුකර තිබු අතර මෙය ආරවුල් මණ්ඩලය මඟින් නිරාකරණය කර ගැනීමට නොහැකි වීම මත බේරුම්කරණය සඳහා යොමු කර ඇත. | ඉඩම පවරාදීමට ප්‍රමාදවීම සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කළමනාකරණය හේතුවෙන් ප්‍රමාදය සිදුවී ඇත. | ව්‍යාපෘතිය අවසන් කිරිම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම. |
| iv. 2021 වර්ෂයේදී ප්‍රතිපත්ති සහයක කණ්ඩායම් රැස්වීම් 1ක් පමණක් පවත්වා තිබු අතර 2010 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රතිපත්ති සහයක කණ්ඩායම් වෙනුවෙන් රු.41,236,786 ක මුදලක් දීමනා ලෙස ගෙවා තිබුණි. සමස්ත අපජල ව්‍යාපෘතියම සෙමින් චලනය වන ව්‍යාපෘතියක් බවට පත්වී තිබිමත්, ව්‍යාපෘතිය අවසන් කර ගැනීමට නොහැකි වීමේ දැඩි අවධානමක් ඇති වී තිබිමත් මත ප්‍රතිපත්ති සහයක | ව්‍යාපෘතියේ සේවකයන් ලෙස සලකා දීමනා ගෙවා ඇත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සක්‍රිය ලෙස දායකවිය යුතු අතර නිළධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරිම. |

| | | |
|---|---|---|
| කණ්ඩායම් වලින් ඵලදායී කාර්යභාරයක් ඉටුවුයේද යන්න විගණනයේදී තහවුරු කළ නොහැකි විය. | | |
| **(එ) මහා කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරිම සඳහා වූ ආයෝජන වැඩසටහන - ණය අංකය 3030 – 2021** | | |
| i. ණය ගිවිසුම ප්‍රකාරව 2014 ජුනි 03 ආරම්භ කර 2019 ජුනි 30 අවසන් කළ යුතු වුවත් සැලසුම් කාර්යයන් අදාල කාල සීමාව තුල නිම කිරිමට නොහැකි වීම මත 2022 ඔක්තෝම්බර් 24 දක්වා කාලය දීර්ඝ කර තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ. | ව්‍යාපෘතිය අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමේ කඩිනම් වැඩ කටයුතු අවසන් කර ගැනීමට ක්‍රියාකල යුතුය. |
| ii. මාදම්පිටිය අපජල පවිත්‍රාගාරය ඉදිකිරිම, අපවහනය නොකළ ප්‍රදේශ 07 සඳහා මලාපවහන පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිය, පවතින කුඩා පොම්පාගාර 5 ඉදිකිරිමේ ව්‍යාපෘතිය, මාලිගාවත්ත පොම්පාගාරයේ සිට මාදම්පිටිය පොම්පාගාරය දක්වා වූ බෙස්ලයින් මලාපවහන මාර්ගය, උතුරු අපජල පෝෂක ප්‍රදේශයේ මලාපවහන වැඩිදියුණු කිරිම යන උප ව්‍යාපෘති වලට අදාලව උපදේශන කොන්ත්‍රාත්තු ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම මත තාවකාලිකව නවතා තිබුණි. | විදේශ ණය අරමුදල් සපයා ගන්නා තෙක් මෙම කාර්යයන් ප්‍රමාද කිරිමට සිදුවී ඇත. | -එම- |
| iii. කි.මී.92.5 ක මලාපවහන නල වල තක්සේරුව හා හදිසි අළුත්වැඩියා කොන්ත්‍රාත්තුව සඳහා 2016 වර්ෂයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබු නමුත් කොන්ත්‍රාත්තුව 2021 ඔක්තෝම්බර් මස ප්‍රදානය කර තිබුණි. මේ අනුව ලංසුකරුවකු තෝරා ගැනීමට වසර 5 කට වැඩි කාල සීමාවක් ගත කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 1 පමණක් වූ අතර 2022 ඔක්තෝම්බර් 24 දින ණය ගිවිසුමේ හා උපදේශන කොන්ත්‍රාත්තුවේ කාලය අවසන් වන බැවින් කොන්ත්‍රාත්තුව අවසන් කර ගැනීමට නොහැකි වීමේ දැඩි අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති වලට අදාල ප්‍රසම්පාදන කටයුතු සඳහා ගතවන කාලය වැඩිවීම වලක්වා ගත නොහැකි කරුණකි. | -එම- |

| | | |
|---|---|---|
| **(ඒ) මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය. ණය ගිවිසුම් අංක 2557/2558 - 2021** | | |
| i. ජල පොම්පාගාර ව්‍යාපෘතිය 2010 අප්‍රේල් 09 දින ආරම්භ කර 2015 ජුනි 30 දින අවසන් කල යුතුව තිබූ නමුත් වැඩ අවසන් කල යුතු දිනය 2022 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 4 දී දින දීර්ඝ කර තිබුණි. 2022 මාර්තු 31 දින වන විටත් මාලිගාවත්ත, බොරැල්ල, විට්ස්වයික්, සහ තිඹිරිගස්යාය යන අපජල පොම්පාගාර වල භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 76,64,71 සහ 74 විය. එමෙන්ම වනාතමුල්ල සහ විට්ස්වයික් යන Pumping Mains වල 2022 මාර්තු 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 61 මට්ටමේ පැවතුනි. මේ අනුව අපජල පොම්පාගාර ව්‍යාපෘතිය අවසන් කර ගැනීමට නොහැකි වීමේ දැඩි අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | වලක්වාගත නොහැකි කරුණු නිසා ව්‍යාපෘතිය ප්‍රමාද වී ඇත. | ව්‍යාපෘතිය කල් පිරිමට ප්‍රථම අවසන් කර ගැනීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ii. මාලිගාවත්ත පොම්ප මධ්‍යස්ථානය සම්බන්ධයෙන් පවතින බේරුම්කරණ කටයුත්ත සඳහා විශේෂඥවරුන් තිදෙනෙකු 2021 අප්‍රේල් 09 දින පත්කර 2021 දෙසැම්බර් 31 දින වන විට එම නිළධාරීන් තිදෙනා හට එකතුව රු.1,736,128 ක මුදලක් ගෙවා තිබුණි. නමුත් මෙම නිළධාරින් පත් කිරිමට හා ඔවුනට දීමනා ගෙවීමට අදාලව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | නිරීක්ෂණය හා එකඟ වේ. | ව්‍යාපෘතියේ අරමුණු වලට පරිභාහිර වියදම් අවම කර ගැනීමට ක්‍රියා කිරිම. |

**3.7 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අංක PF-5910 හා PE-8364 දරන වාහන 2018 ඔක්තෝබර් 17 දින එවකට නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් නිපුනතා සංවර්ධන අමාත්‍යාංශයට රැගෙන ගොස් තිබූ අතර එම වාහන පවරා ගැනීමට හෝ ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර | PF-5910 හා PE-8364 මෙම අමාත්‍යාංශය වෙත ලබා දෙන ලෙස නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වෙත ලිපියක් යවා ඇත. KE-4249 සමාජ සුභසාධන හා ප්‍රාථමික | ආපසු ලබා ගැනීම හෝ පවරා දීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. අංක 252 – 6707 දරන කැබ් රථය තංගල්ල ප්‍රාදේශීය සභාවට ලබා දී ඇතත් පවරාදීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.<br>අංක KE-4249 දරන වාහනය 2018 ජුනි 21 දින සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වෙත භාර දී තිබුණද ආපසු ගෙන්වා ගැනීමට හෝ පවරාදීමට කටයුතු කර නොතිබුණි.<br><br>අමාත්‍යාංශය සතුව තිබුණු අංක KA-0127 දරන කැබ් රථය, අංක 17-5496 මෝටර් රථය සහ අංක WK-1941 හා WK-1936 **දරන** යතුරුපැදි 02 සම්බන්ධයෙන් තොරතුරු මේ දක්වා සොයා ගෙන නොතිබුණි. | කර්මාන්ත නමින් අමාත්‍යාංශයක් මේ වන විට නොමැති බැවින් එම වාහනය දැනට ඇති අමාත්‍යාංශය සොයා ගත් වහාම ලිපියක් යැවීමට කටයුතු කරනු ලැබේ. KA-0127 වාහනය සම්බන්ධයෙන් ද නිශ්චිත තොරතුරු සොයා ගැනීමට තවමත් නොහැකි වී ඇති අතර ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරනු ලැබේ.<br>252-6507 තංගල්ල ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ඇති කැබ් රථයකි. එය පවරා ගැනීමට කටයුතු කරන ලෙස එම ප්‍රාදේශීය සභාවට දන්වා ඇත.<br>**WK-1941** හා **WK-1936** අංක දරන යතුරු පැදි දෙක සම්බන්ධව නිෂ්චිත තොරතුරු මේ දක්වා ලැබී නොමැති අතර එම තොරතුරු ලද වහාම ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව අමාත්‍යාංශය විසින් වෙනත් අමාත්‍යාංශයකට අයත් වාහන 02ක් භාවිතයට ගෙන තිබුණි. | එකී වාහන තාවකාලිකව ලබා ගෙන ඇති බැවින් නැවත පෙර අමාත්‍යාංශ වෙත භාර දීමට පියවර ගනිමින් පවතී. | වාහන පවරාගැනීමට හෝ ආපසු භාර දීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මුදල් අමාත්‍යාංශය විසින් මෙම අමාත්‍යාංශයට සහ පළාත් පාලන ආයතනවලට ලබා දී තිබූ වාහන 27ක කල්බදු වාරික ගෙවීම, 2021නොවැම්බර් වන විට සම්පූර්ණ කර අයිතිය පවරා ගැනීමට උපදෙස් ලබා දී තිබුණ ද එම වාහන 2022 ජූලි 31 වන විටද අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි. | කල් බදු ක්‍රමය යටතේ ලබා ගත් වාහන වලට අදාල ලියාපදිංචි සහතික හා ලේඛන අදාල බැංකු මඟින් ගෙන්වා ගෙන මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | එම වාහන පවරා ගැනීම කඩිනමින් අවසන් කල යුතුය |

**3.8 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේදී රු.මිලියන 104 ක වියදමෙන් මිලදී ගත් කාත්තන්කුඩි නගර සභාව යටතේ සවිකිරීමට නියමිතව තිබූ කවෂිමා යන්ත්‍රයට ගිනි හානියක් සිදු වී තිබූ අතර, රුපියල් මිලියන 30.62ක් ගෙවා හානි වූ අමතර කොටස් ගෙන්වා තිබුණද මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව විධිමත් පරීක්ෂණ සිදු කර නොතිබුණි. | 2020.06.07 දින ගිනි ගැනීමට ලක්වීමට අදාළව මු.රෙ.104 (3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව පමණක් 2020 වසරේදී සිදු කර ඇති බව නිරීක්ෂණය කරමි. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුත්තන් හඳුනාගැනීමට හා අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.9 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සඳහා කොළඹ 7 මළලසේකර මාවතේ මහල් 8කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම 2013 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර ප්‍රසම්පාදන විෂමාචාරයන් ඇතුළු විවිධ විෂමාචාර හේතුවෙන් පයිල් අත්තිවාරම දැමීමෙන් අනතුරුව ලේකම්වරයා විසින් විෂමාචාරයන් සිදුව ඇති බව 2020 අගෝස්තු 31 දින දන්වා තිබියදී ඊට අදාලව ගත යුතු ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කමිටුවක් පත් කර ඇති අතර, කොන්ත්‍රාත්කරු ඉටුකළ කාර්යයේ සත්‍ය වටිනාකම හා සම්පූර්ණ කිරීමට පවතින කාර්යයන් තක්සේරු කිරීමත්, දැනට කර ඇති ගෙවීම් හා කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර ඇති බිල් පිළිබඳ නිර්දේශ ලබා දීමත් එම කමිටුව මඟින් සිදු කළ යුතුව ඇත. ඒ අනුව එම කමිටුව විසින් වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුව ඇත. | විෂමාචාරයන්ට එරෙහිව විධිමත් පරිදි කටයුතු කළ යුතුය |
| (ආ) | 2014 දෙසැම්බර් 14 දිනැති ප්‍රසම්පාදන තීරණයට අනුව මහල් 8කින් සමන්විත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 135.94කි. ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාලයේ 2021 ජුනි 16 දින ලබා දී ඇති ඇස්තමේන්තුව අනුව මහල් 6කින් යුතුව මෙම ගොඩනැගිල්ල නිමකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 626.33කි. නිවැරදි ප්‍රසම්පාදන තීරණයක් නොගැනීම | **2014.12.14** ප්‍රසම්පාදන නිරීක්ෂණයට අනුව කොන්ත්‍රාත්තුවේ සංශෝධිත නව අගය රු. මිලියන **98.44**ක් වන අතර එම කොන්ත්‍රාත්තුවට ඇතුළත් වනුයේ අත්තිවාරම් කුළුණු **(Pile)** මහල් **08**ට ඉදි කිරීමත් මහල් **04**ක ව්‍යුහය පමණක් ඉදි කිරීමත් වේ. එම ගොඩනැගිල්ලේ වහලය සහ මහල් වල අවසන් නිමාව **(Finishing Work)** එම කොන්ත්‍රාත්තුවට ඇතුලත්ව නැත. | රජයට සිදුව ඇති පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් රජයට සිදුව ඇති පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග මෙතෙක් ගෙන නොතිබුණි. | කෙසේ වුව ද **2018.01.03** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මේ සම්බන්ධයෙන් ඉදිරි තීරණ ගැනීමට කටයුතු කරමින් පවතී. | |
| (ඇ) | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ කිරම බස්නැවතුම්පල හා වැලිපිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ නව ගොඩනැගිල්ලට විදුලි සෝපානයක් ඉදිකිරීමේදී සිදුව ඇති විෂමාචාරයන්ට සම්බන්ධ වගකිව යුතු පාර්ශවයන් එනම්, කොන්ත්‍රාත්කරු, උපදේශක සමාගම, ගෙවීම් අනුමත කළ, නිර්දේශ කළ හා සහතික කළ නිලධාරීන්ට එරෙහිව විධිමත් පරිදි කටයුතු නොකර ප්‍රාදේශීය සභාවට අධිහාර කිරීමට තීරණය කර තිබුණි. | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ කිරම බස් නැවතුම් පළ හා වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ නව ගොඩනැගිල්ලේ විදුලි සෝපානය ඉදි කිරීමේ දි සිදුව ඇති විෂමාචාරයන් සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව ගත හැකි නීතිමය පියවර පිළිබඳ නීතිපතිගෙන් උපදෙස් ලබා ඇත. එහිදී නීතිපති විසින් ලබා දෙන ලද උපදෙස් පරිදි අදාල කොන්ත්‍රාත්කරුට හා උපදේශක ආයතනයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් එකී ගොඩනැගිල්ල සහ විදුලි සෝපානය ඉදිකිරීම සම්බන්ධව මූලික තීරණ ගෙන ඇති ප්‍රාදේශීය සභාවට අධිහාර කිරීමටත් නීතිපතිගෙන් ලද උපදෙස් පරිදි එකී තීරණ ගෙන ඇත. | වගකිව යුතු පාර්ශව වලට එරෙහිව කටයුතු කළ යුතුය |
| (ඈ) | **විද්‍යුත් පුස්තකාල ඉදිකිරීම** | | |
| | (i) 2021 සැප්තැම්බර් මස ඉදිකිරීම් ආරම්භ කිරීමට යෝජිතව තිබූ පුස්තකාල 50න් 42ක් පමණක් ඉදිකිරීම් කටයුතු සිදුවන අතර 08ක ඉදිකිරීම් අවලංගු කර තිබුණි. නමුත් යෝජිත පුස්තකාල 50 සඳහාම අවශ්‍ය තාක්ෂණික උපකරණ හා කාර්යාලීය ගෘහභාණ්ඩ ශ්‍රී ලංකා වාණිජ නීතිගත සංස්ථාවෙන් රු. මිලියන 16.3 කට මිලදී ගෙන තිබුණි. ගොඩනැගිලි ඉදිකිරීම්වල ප්‍රගතියක් නොමැති අවස්ථාවක කාර්යාල උපකරණ ලබා ගෙන නිෂ්කාර්යව තබා ගැනීමෙන් තාක්ෂණික උපකරණවල වගකීම් කාලය ඉක්මවීමක් සිදුවන බව නිරීක්ෂණය විය. | මිලදී ගන්නා ලද පුස්තකාල උපකරණ නිෂ්ක්‍රීයව පැවැතීම වැලැක්වීම සඳහා වැඩ නිම කරන ලද පුස්තකාල කඩිනමින් විවෘතත කිරීමට කටයුතු කරන ලෙස මේ වන විටත් උපදෙස් දී ඇත.වැඩ නිම නොවූ පුස්තකාල වලට අදාල ඊ පුස්තකාලයන් සඳහා භාවිතයට ලබා දී ඇත.<br>සැලසුම් කල පරිදි පුස්තකාල ගොඩනැගිලි 08ක ඉදිකිරීම් කටයුතු ඉදිකිරීමට නොහැකි වූ බව හා උපකරණ කට්ටල 08ක් ඉතිරි බවද ප්‍රසම්පාදන කමිටුවේ අවදානයට යොමු කර ඇත. ඒවා වෙනත් පළාත් පාලන ආයතන වෙත බෙදා හැරීමට ප්‍රසම්පාදන කමිටුව දැනුම් දෙන ලදී. | -එම- |
| | මෙම උපකරණ නිෂ්කාර්ය බව පෙනීම වැලැක්වීම සඳහා | මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා අදාල උපකරණ අත්‍යාවශ්‍ය | |

| | | |
|---|---|---|
| බස්නාහිර පළාත හැර අනෙක් පළාත් පාලන ආයතන වෙත භාරදීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කර තිබුණු අතර, කාර්යාල උපකරණ හා තාක්ෂණික උපකරණ මිල දී ගැනීමට උචිත අවශ්ථාව එළඹිමට පෙර මිලදී ගැනීමට තීරණය කළ, අනුමත කළ, නිර්දේශ කළ සියළුම නිලධාරීන් මේ සම්බන්ධයෙන් වගකිව යුතුව ඇත. | වන අතර එම අවශ්ථාවේ උපකරණ මිලදී නොගත්තේනම් රටේ පවතින වර්ථමාන ආර්ථික තත්ත්වය අනුව මිලදී ගැනීමට සුලකිය යුතු කාලයක් ගතවන අතර ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදු වේ. | |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම අමාත්‍යාංශය යටතේ විදේශාධාර ව්‍යාපෘති 08ක් ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා වෙන් වෙන් වශයෙන් ව්‍යාපෘති කාර්යාල හා කාර්යය මණ්ඩල පවත්වාගෙන ගියද එම ව්‍යාපෘතිවල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබිණි. | මේ වන විට අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක යටතේ ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු බඳවාගෙන එම අංශය ශක්තිමත් කොට ඇති අතර ඒ අනුව අදාළ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනයන් සිදු කිරීම පුළුල් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් පරිදි ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනය සිදු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මෙම අමාත්‍යාංශයේ සේවයේ නියුතු විධායක නිලධාරීන් 26 දෙනෙකු අතරින් 8 දෙනෙකු වසර 5කට වැඩි සේවා කාලයක් මෙම අමාත්‍යාංශයේ සේවයේ නියුතු වන අතර, ප්‍රධාන මූල්‍ය නිලධාරිණියගේ මෙම අමාත්‍යාංශයේ අඛණ්ඩ සේවා කාලය වසර 20ක් විය. | රුපියල් බිලියන 300 කට වැඩි වාර්ෂික ඇස්තමේන්තුවක් සහිත මෙවැනි විශාල අමාත්‍යාංශයකට පලපුරුදු නිළධාරීන්ගේ සේවය අත්‍යවශ්‍ය වේ. එසේම මෙම අමාත්‍යාංශය නිරන්තරයෙන් වෙනස්වන අමාත්‍යාංශයක් වීමද ස්ථාන මාරුවීම් විධිමත් නොවීමට හේතු විය. කෙසේ වුවද වාර්ෂික ස්ථාන වාරුවීම් මත ඉදිරියේදී මෙම නිළධාරීන්ගේ මාරුවීම් සම්බන්ධයෙන් කටයුතු කෙරෙනු ඇත. | නිලධාරීන් දීර්ඝ කාලයක් එකම ආයතනයක රැඳී නොසිටිය හැකි සේ කලින් කල ස්ථාන මාරුවීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නීති අංශය, නීති නිලධාරී ඇතුලත්ව නිලධාරීන් 10 දෙදෙනෙකුගෙන් හා කාර්යාල කාර්ය සහායක 01 අයෙකුගෙන් සමන්විත වී තිබූ අතර, එම නිලධාරීන් 05 දෙනෙකුගේ රාජකාරි ලැයිස්තු 2021 දෙසැම්බර් 31 දින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි. එක් නිලධාරියෙකුට ලිපි ගොනු ලේඛනයක් මඟින් ලිපි ගොනු භාර දීම හැර විධිමත් ආකාරයට රාජකාරී පවරා නොතිබුණි. නීති අංශය වෙත අවශ්‍යතාවයට වඩා කාර්යය මණ්ඩලය අනුයුක්ත කර තිබුණි. | නීති අංශයේ රාජකාරීන් ඒ ඒ වසරේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වෙනස් වන බැවින් යම්යම් අවස්ථා වලදී එකී රාජකාරියට ගැලපෙන පරිදි අදාල රාජකාරීන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටුකල හැකි විකල්ප නිළධාරීන් යෙදවීමට සිදුවේ. | කාර්යභාරයට ගැලපෙන පරිදි කාර්යමණ්ඩලය අනුයුක්ත කිරිමටත් අතිරික්ත කාර්ය මණ්ඩලය අවශ්‍ය ස්ථාන වෙත අනුයුක්ත කිරීමත් කළ යුතු ය. |
| (ඇ) | 2018 අගෝස්තු 06 දින නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියට බදවාගත් කළමනාකරණ සහකාර නිලධාරිනිය පත්වීම් දිනයේ සිට මේ දක්වා අතිරේක ලේකම්ගේ (ව්‍යාපෘති) පෞද්ගලික සහකාර ලෙස සේවයේ නිරත වී තිබුණි. ව්‍යාපෘතිය මඟින් එම නිලධාරිනිය වෙත 2018 හා 2019 වර්ෂ සඳහා රු.787,335ක්ද, 2020 වර්ෂය සඳහා රු.787,335ක් ගෙවා තිබුණි. 2021 වර්ෂය සඳහා රු.592,920 ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ සේවය සඳහා වෙනත් පළපුරුදු නිළධාරියෙකු අනියුක්ත කර ඇති අතර අතිරේඛ ලේකම් (ව්‍යාපෘති)ගේ සේවය සඳහා මෙම නිළධාරිනිය යොදාගෙන ඇත. මේ සම්බන්ධයෙන් සුදුසු පරිදි ඉදිරි පියවර ගැනීමට අපේක්ෂිතය. | ව්‍යාපෘතිය සඳහා බදවාගත් නිලධාරිණිය ඒ සඳහා නිදහස් කළ යුතුය. |